# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1950/49 - 2016 ජනවාරි මස 22 වැනි සිකුරාදා - 2016.01.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා.අංකය : සීඑස්ජ්/7/සීඕඅයි/එම්එස් /01.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් විසිනි**

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

1. ප්‍රීති පද්මන් සූරසේන මැතිතුමා
   අභියාචනාධිකරණ විනිශ්චයකාර

2. දේගිරි අමේන්ද්‍ර මෙන්ඩිස් සෙනෙවිරත්න මැතිතුමා
   මහාධිකරණ විනිශ්චයකාර

3. කුලතුංග මුදියන්සේලාගේ හිහාන් හිමාන්ශු කුලතුංග මැතිතුමා
   මහාධිකරණ විනිශ්චයකාර

4. පස්දුන්කෝරලේ ආරච්චිගේ පේමතිලක මැතිතුමා
   විශ්‍රාමික විගණකාධිපති

5. විකුම් අතුල කළුආරච්චි මැතිතුමා
   මහාධිකරණ විනිසුරු

වෙත,

ශුභාශිංසන පූර්වකවයි !

පරීක්ෂණ කොමිෂන් සභා පනතේ (393 වැනි අධිකාරය වූ) 2 වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාර, වර්ෂ 2015 ක් වූ මාර්තු මස 03 වැනි දිනැති අධිකාරි පත්‍රය මගින්, මවිසින් පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවා ඇති හෙයින්ද,


1A - G 22912 — 11 (2016/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තවද, එකී පරීක්ෂණ කොමිෂන් සභාවෙහි කොමසාරිස්වරයෙකු හා සභාපතිවරයා වශයෙන් කටයුතු කරන ලද මහාධිකරණ විනිසුරු ප්‍රීති පද්මන් සූරසේන මැතිතුමා, අභියාචනාධිකරණ විනිසුරුවරයකු වශයෙන් පත්කර ඇති හෙයින්ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 3 වන වගන්තියේ විධිවිධානයන්ට අනුකූලව අභියාචනාධිකරණ විනිසුරු ප්‍රීති පද්මන් සූරසේන මැතිතුමා, එතුමාගේ විචක්ෂණභාවය, සාමාර්ථය හා විශ්වාසවන්තභාවය කෙරෙහි මහත්වූ භක්තිය හා විශ්වාසය තබමින්, ඉහත කී අධිකාරි පත්‍රය ප්‍රකාර ස්ථාපනය කරනු ලැබූ පරීක්ෂණ කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් මෙයින් පත් කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් දහසයක් වූ ජනවාරි මස 20 වන දින වූ මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

පී. බී. අබේකෝන්,
ජනාධිපති ලේකම්.

02 - 218